# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

## ඇබෑර්තු

## රත්මලාන පරිශ්‍රය

### පරිපාලන කාර්ය මණ්ඩලය - එක් අවුරුදු කොන්ත්‍රාත් පදනම

(1) සහකාර මූල්‍යාධිකාරී තනතුර

### අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය - ස්ථිර පදනම

**තොරතුරු තාක්ෂණ හා ප්‍රවර්ධන මධ්‍යස්ථානය**

(2) ජාල පරිපාලක II ශ්‍රේණිය තනතුර

### ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි - ස්ථිර පදනම

(3) තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය (ආ) කාණ්ඩය තනතුර

## දක්ෂිණ මණ්ඩපය - සූරියවැව

### අධ්‍යයන කාර්ය මණ්ඩලය - ස්ථිර පදනම

**තාක්ෂණ පීඨය**
**ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යනාංශය**

**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය ධාරාව**

**(4) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (ස්ථිර නොකල) තනතුර, කථිකාචාර්ය (පරිවාස) තනතුර**

**සුදුසුකම් සහ බඳවා ගැනීමේ පරිපාටිය**

**අධ්‍යයන කාර්ය මණ්ඩලය - ස්ථිර පදනම**

01. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර I/ II ශ්‍රේණිය**

i. ඉල්ලුම්කරුවන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 02 හි ඇති පරිදි කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා අවශ්‍ය කරනු ලබන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සහ

ii. අ. අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක්.

හෝ

ආ. අවම වශයෙන් මාස 24 ක කාලයකින් යුත් පූර්ණ කාලීන පර්යේෂණයක් සහිතව ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම.

හෝ

ඇ. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ තේරීම් කමිටුවේ නිර්දේශය මත කළමණාකරණ මණ්ඩලය මගින් අනුමත කරන ලද ඉහත ආකාරයේ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද

සහ

iii. අ. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර I ශ්‍රේණිය** - පහත සඳහන් අංශ වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අවම වශයෙන් වසර දොළහක (12) ක පළපුරුද්ද (ඉහත (ii) හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් පසුව අවම වශයෙන් වසර හයක (06) ක පළපුරුද්ද තිබිය යුතුය.)

ආ. **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - තනතුර II ශ්‍රේණිය** - පහත සඳහන් අංශ වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා අවම වශයෙන් වසර හයක (06) ක පළපුරුද්ද

අ. විශ්වවිද්‍යාල මට්ටමින් ඉගැන්වීම
ආ. වෘත්තීය පළපුරුද්ද
ඇ. පිළිගත් ආයතනයක සිදුකරන ලද පර්යේෂණ
ඈ. පශ්චාත් උපාධි අධ්‍යයන

**02. කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර**

i. ඉල්ලුම්කරුවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තනතුරු අංක 02 හි (1) හෝ (2) කාණ්ඩය පරිදි කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා අවශ්‍ය කරන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

සහ

ii. අ. අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් සම්පූර්ණ කර තිබීම.

හෝ

ආ. අවම වශයෙන් මාස 24 ක කාලයකින් යුත් පූර්ණ කාලීන පර්යේෂණයක් සහිතව ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම.

සහ

iii. මෙම ලේඛනයෙහි තනතුරු අංක 1 හි සඳහන් පරිදි ජේ.කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුරට අදාළ වූ වසර 06 ක පළපුරුද්දට වඩා අඩු පළපුරුද්ද.

**03. කථිකාචාර්ය (පරිවාස) තනතුර**

i. අදාල විෂයය සඳහා විශේෂඥතාවය සහිතව පළමු හෝ දෙවන පන්තියේ (ඉහළ පෙල) සාමාර්ථයක් සහිත ගෞරව උපාධියක්

හෝ

ii. අදාල විෂයය සඳහා විශේෂඥතාවය සහිතව දෙවන පන්තියේ (පහළ පෙල) සාමාර්ථයක් සහිත ගෞරව උපාධියක්

හෝ

iii. අ. අදාල විෂය සඳහා විශේෂඥතාවය සහිතව ලබාගත් උපාධිය හෝ අවම වශයෙන් දෙවන පන්තියේ සාමාර්තයක් සහිත වෙනත් ඕනෑම උපාධියක්

සහ

ආ. වර්ෂ 02 කට නොඅඩු නිබන්ධන/ ශාස්ත්‍රීය නිබන්ධන සමග පර්යේෂණ අංගයක් සහිත පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම

හෝ

iv. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ තේරීම් කමිටුවේ නිර්දේශය මත කළමණාකරණ මණ්ඩලය මගින් අනුමත කරනු ලබන අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද.

විෂය ක්ෂේත්‍රඃ - තොරතුරු හා සන්නවේදන තාක්ෂණය

පරිගණක ක්‍රමලේඛනය (C, C++, Java, Python), මෘදුකාංග ඉංජිනේරු, DBMS (MySQL , SQL , Oracle DB) මෘදුකාංග තත්ව සහතිකකරණය, Cloud Computing & VM, සයිබර් ආරක්ෂාව, ග්‍රැෆික් නිර්මාණ සහ දෘෂ්‍ය පරිගණකකරණය, පරිගණක දෘඩාංග සහ ජාලකරණය, ව්‍යාපාර තොරතුරු පද්ධති, ජංගම දුරකථන ක්‍රමලේඛන යෙදුම් සංවර්ධනය සහ පරිගණක ක්‍රීඩා සංවර්ධනය

විශේෂ සටහනඃ විද්‍යාවේදී හෝ විද්‍යාවේදී (ගෞරව) තොරතුරු හා සන්නවේදන තාක්ෂණය (හෝ සමානව නම් කරන ලද) හෝ විද්‍යාවේදී (ගෞරව) පරිගණක විද්‍යාව (හෝ සමානව නම් කරන ලද) හෝ විද්‍යාවේදී (ගෞරව) පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ ආශ්‍රිත මූලික උපාධියක් හා ඉහත විෂය ක්ෂේත්‍රයන්ට සම්බන්ධ පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අපේක්ෂකයන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**පරිපාලන කාර්ය මණ්ඩලය - එක් අවුරුදු කොන්ත්‍රාත් පදනම**

- සහකාර මූල්‍යාධිකාරී තනතුර

1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ ඊට සමාන ආයතනයක II වන (අවසාන) විභාගය සමත් විය යුතුය.

හෝ

2. (අ) (i) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබිය යුතුය.

හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් සමඟ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ ඊට සමාන ආයතනයක මධ්‍යම මට්ටම විභාගය සමත් විය යුතුය.

හෝ

(iii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයෙන් (SLIATE) හෝ එහි පුරෝගාමී ආයතනයකින් ලබාගත් ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) ලබා තිබිය යුතුය.

සහ

(ආ) රාජ්‍ය ආයතනයක/රජයේ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගිණුම්කරණය/විගණන කාර්යය සම්බන්ධ වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

වයස: අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය - ස්ථිර පදනම**

- ජාල පරිපාලක II ශ්‍රේණිය තනතුර

01. පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියකින් පළමුපෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

02. (අ). පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් සමත් වී තිබීම.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණනය විෂයයක් ලෙස ඇතුලත්ව ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය පළමු හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සහිතව සමත් වී තිබීම.

සහ

(ආ). පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

හෝ

03. (අ). පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණනය විෂයක් ලෙස ඇතුලත්ව ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය ( පරිගණනය විෂයක් ලෙස ඇතුලත් නොවූ )

සහ

(ආ). පරිගණක ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්ද

හෝ

04. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය (පරිගණනය විෂයයක් ලෙස ඇතුලත් නොවූ)

සහ

පරිගණක ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්ද

හෝ

05. වෙනත් ඕනෑම උපාධියක්

සහ

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව / පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

සහ

පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

**විශේෂ සටහන**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ජාල ඉංජිනේරු / පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහිත සහ පළපුරුද්ද ඇති අයදුම්කරුවන් පමණක් සලකා බලනු ලැබේ.

Professional program/ Certification related to Networking (Eg. CCNA, RHCSA, MCSA., etc…) Analytics පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

## ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි - ස්ථිර පදනම

- තාක්ෂණික නිලධාරි - II ශ්‍රේණිය (ආ) කාණ්ඩය තනතුර

**අවම සුදුසුකම්**

(i) එක් වරකදී අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් විෂයන් 03 කින් සමත් වී තිබීම.

සහ

(ii) තනතුරට අදාලව අවම වශයෙන් එක් වසරක හෝ ඊට ආසන්න (පූර්ණ කාලීන) නිපුණතා පාදක පුහුණු වැඩසටහනකින් සමත් වීම.

වයස :අවු. 18 ට නොඅඩු සහ අවු. 35 ට නොවැඩි විය යුතුය.

## වැටුප් පරිමාණ

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුර
   :- U-AC 3 (I) Rs. 91,310 - 7x2,170 – 106,500 p.m. + (151% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර
   :- U-AC 3 (II) Rs. 79,360 - 11x1,630 – 97,290 p.m. +(151% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

3. කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර
   :- U-AC 3 (III) Rs. 69,580 - 5x1,630 – 77,730 p.m. + (131% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

4. කථිකාචාර්ය (පරිවාස) තනතුර
   :- U-AC 3 (IV) Rs. 54,600 - 10x1,335 – 67,950 p.m. + (115% අධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

5. සහකාර මූල්‍යාධිකාරි තනතුර (කොන්ත්‍රාත් පදනම)
   :- Rs. 50,625 p.m. + (Rs. 7,800 ජීවන වියදම් දීමනාව + Rs. 5,000 මාසික දීමනාව)

6. ජාල පරිපාලක II ශ්‍රේණිය තනතුර
   :- U-AS 2 (II) Rs. 50,625 – 3x1,335 – 54,630 (EB) 55,965 – 14x1,335 – 74,655 p.m. + (Rs. 7,800 ජීවන වියදම් දීමනාව + Rs. 5,000 මාසික දීමනාව + 45% අනධ්‍යයන දීමනාව + 20% අමතර දීමනාව)

7. තාක්ෂණික නිලධාරි II ශ්‍රේණිය (ආ) කාණ්ඩය තනතුර
   :- U-MT I (III A) – Rs. 31,625 – 07x300; 10x355 – 37,275 p.m. + (Rs. 7,800 ජීවන වියදම් දීමනාව + Rs. 5,000 මාසික දීමනාව + 45% අනධ්‍යයන දීමනාව + 20% අමතර දීමනාව)

## බඳවා ගැනීමේ ක්‍රමවේදය

තනතුරට අදාළ වන පරිදි අභියෝග්‍යතා පරීක්ෂණයක හෝ ඉදිරිපත් කිරීමේ ඇගයීමක ප්‍රතිඵල මත පදනම්ව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීම සිදු කෙරේ.

## වෙනත් ප්‍රතිලාභ

**ස්ථිර පදනම**

සුදුසුකම් ලත් තනතුරු සඳහා සප්තවාර්ෂික නිවාඩු, අධ්‍යන දීමනා සහ පර්යේෂණ දීමනාව, සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික දීමනාව සඳහා හිමිකම, නොමිලේ ලබා දෙන සෞඛ්‍ය සහ ජීවිත රක්ෂණය, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාලයීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර, සුබ සාධක ප්‍රවාහන සේවය සහ වෙනත් වරප්‍රසාද.

**කොන්ත්‍රාත් පදනම**

සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම, වාර්ෂික දිරි දීමනා, විශ්වවිද්‍යාලයීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර, සුබ සාධක ප්‍රවාහන සේවය.

## පොදු කොන්දේසි - සියළුම කාර්ය මණ්ඩලය සඳහා

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් තෝරා ගැනීම, ඒ ඒ තනතුරෙහි / ශ්‍රේණියෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වනතෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරනු ඇත.
3. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) භාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකවල සහතික කළ ඡායා පිටපත් සහිතව **2023 මැයි මස 30** වෙනි දිනට හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවීම හෝ ගෙනවිත් භාර දීම කළ යුතුය.
4. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙලවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
5. අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.
6. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.
7. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාල තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිභාහිරව එවනු ලබන අයදුම්පත් සහ ඉහත අංක 06 හි ලබාදී ඇති උපදෙස් අනුගමනය කර නොමැති අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.
8. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය.
9. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.
10. අයදුම්කරුවන් තෝරාගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදුකරනු ඇත.
11. අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණය සහ/ හෝ ප්‍රායෝගික පරීක්ෂණය සහ/ හෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.
12. ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛය අනුව වැටුප් ගෙවනු ලබයි. වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ.
13. කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා තෝරාගත් අපේක්ෂකයින්ට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරට අනුව සඳහන් මූලික වැටුප සහ අනෙකුත් අදාළ දීමනා ගෙවනු ලැබේ.
14. උපකුලපතිවරයාගේ සහ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සතුටුදායක සේවාවක් සම්පූර්ණ කිරීමෙන් පසු කොන්ත්‍රාත් කාලය වර්ෂිකව දීර්ඝ කළ හැක.
15. සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය සහ පහත සඳහන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ හා ඒවායේ විශේෂ සටහන් සඳහා අදාළ සංශෝධන වෙත යොමු වෙන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (පරිවාස) තනතුර - 721, 935, 08/2016, 08/2016 (ii), 08/2016 (iii)

කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර - 07/2018
සහකාර මූල්‍යාධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම) - 15/2017
තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය (ආ) කාණ්ඩය තනතුර - 763

**පොදු කොන්දේසි - අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා**

1. අධ්‍යයන තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් සිය ඉගැන්වීමේ හැකියාව ඔප්පුකර පෙන්වනු පිණිස තේරීම් කමිටුව ඉදිරියේ ඉදිරිපත් කිරීමක් (ඉංග්‍රීසි භාෂාවෙන්) කල යුතුය.

**පොදු කොන්දේසි - පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා**

1. සහකාර මූල්‍යාධිකාරී තනතුර (කොන්ත්‍රාත් පදනම) - අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.

**පොදු කොන්දේසි - අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය සඳහා**

1. ජාල පරිපාලක II ශ්‍රේණිය තනතුර - අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් අභියෝග්‍යතා පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.

**පොදු කොන්දේසි - ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලය සඳහා**

1. තාක්ෂණික නිලධාරී II ශ්‍රේණිය (ආ) කාණ්ඩය තනතුර - අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් අභියෝග්‍යතා පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.


**වැඩි විස්තර සඳහා සම්බන්ධ වන්න:**
කෂ්මි සන්දනායක මෙය
නියෝජ්‍ය ලේඛකාධිකාරී (ආයතන)
T: +94 (0) 11 263 2028 (Ext: 377) | 0710219289
“Staff Recruitment- KDU" <staffrecruit@kdu.ac.lk>